# නිෂ්පාදන හා අලෙවි අමාත්‍ය ගරු විජේරත්න බණ්ඩා මැතිතුමා සමග කළ සම්මුඛ සාකච්ඡාව

**ප්‍රශ්නය :-**

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ නිෂ්පාදන හා අලෙවි අමාත්‍යාංශය මෙරටට අළුතින් හඳුන්වා දෙන ලද්දකි. මෙම අමාත්‍යාංශය ඇති කිරීමට විශේෂ හේතු තියෙනව ද?

**පිළිතුර :-**

ඔව්. අපි කලක් තිස්සේ මුල් තැනක් දුන්නේ නිෂ්පාදනය වැඩිකරන්නට. නමුත් නිෂ්පාදනය, අලෙවියට සම්බන්ධ කරල සැලකුවේ නැහැ. අපේ ගොවීන් නිෂ්පාදනය කරලා ඉවර වෙලා අන්තිමට අලෙවි කරන්න වෙළඳ පොලක් හොයනවා. එතකොට විකිණීමේ ප්‍රශ්න ඇති වෙනවා. නිෂ්පාදනය කිරීමට පෙර වෙළඳපොල ගැන කල්පනා කරන්නේ නැහැ. ගොවීන්ගේ මේ පුරුද්ද වෙනස් කරන්නට අවශ්‍ය වුනා. අන්න ඒ අදහස මුදුන් පත් කිරීමට තමයි මෙම අමාත්‍යාංශය ඇති කළේ.

**ප්‍රශ්නය :-**

ඇමතිතුමාගේ කථාව සම්පූර්ණ ඇත්ත. බොහෝ රටවල්වල තියෙනවා අලෙවිකරණ ව්‍යාප්ති සේවයක්. ඒ වගේ වැඩ පිළිවෙලක් අප රටේත් ආරම්භ කරල තියෙනව ද?

**පිළිතුර :**

ව්‍යාප්ති සේවයක් පැවතුණා. නමුත් ඒකත් අඩපන වුනා. අපේ ක්ෂේත්‍ර මට්ටමේ හිටපු, ගොවිජනතාවට සමීපවම හිටපු, කෘෂිකර්ම ව්‍යාප්ති සේවක, වගා නිලධාරී වගේ අය ග්‍රාම සේවක සේවයට අනුයුක්ත කිරීම නිසා ව්‍යාප්ති කටයුතු අඩාලවුනා.

**ප්‍රශ්ණය :**

දැනට තිබෙන ව්‍යාප්ති සේවය තුළින් අලෙවිකරණ කටයුතු පිළිබඳ ගොවීන් දැනුවත් කරන්න, ඒ කියන්නේ ගොවිජනතාව අතරට අලෙවිකරණ පණිවුඩ ගෙනියන්න කුමන හෝ වැඩ පිළිවෙලක් තියෙනව ද?

**පිළිතුර :-**

දැනට අපි ඒ කටයුතු කරන්නෙ ගොවිසංවිධාන මගින්. මෙතෙක් ගොවීන් කලේ තම තමන්ගේ ප්‍රශ්න තනි තනිව වගකිව යුත්තන්ට දැනුම් දීමයි. ඒ ප්‍රශ්න සාමූහිකව විසඳ ගන්න ඔවුන් සංවිධානය වෙලා හිටියෙ නැහැ. දැන් ගොවීන් සංවිධානය වීමට නැඹුරු වෙලා තියෙන හින්ද දැන් අපට ඒ අයගේ ප්‍රශ්න සාමූහිකව විසඳ ගන්නත් වග කිව යුත්තන්ට දැනුම් දෙන්නත් පුලුවන්. ඒ වගේම දෙපාර්තමේන්තුවෙන් හා රජය පැත්තෙන් ඔවුන් වෙත පණිවුඩයක් දෙන්න තියෙනවා නම් ඒකටත් ක්‍රමයක් සකස් කරලයි තියෙන්නෙ.

**ප්‍රශ්නය :-**

ගොවි ජනතාව තනි තනිව හිටියොත් පණිවුඩයක් දෙන්න අමාරු බව ඇත්ත. ඒ අනුව ඔබ තුමාගේ බලාපොරොත්තුව ගොවි සංවිධාන මාර්ගයෙන් ඒ දැනුම ලබා දීමයි. ඒ අනුව දැනට පිහිටුවා ඇති ගොවි සංවිධාන ආරක්ෂිත අන්දමට ක්‍රියාත්මක වෙනවා ද?

**පිළිතුර :-**

ගොවි සංවිධාන වලින් වැඩි ප්‍රමාණයක් තවමත් තියෙන්නෙ ළදරු අවස්ථාවෙ. සමහර ගොවි සංවිධාන සාර්ථකව වැඩ කරනවා. සමහර ඒවා තවමත් සාර්ථකව ක්‍රියාත්මක කරනවා ද කියා සැකයක් තියෙනවා. හේතුව මුලින් අපි ගමේ ග්‍රාමසේවක මහතාට තමයි මේවා පිහිටුවන්න කියලා භාර දුන්නේ. ඒ නිසා සමහර සංවිධාන ගමේ ගොවීන් හැටියට සංවිධාන පිහිටුවලා තියෙන්නෙ. ඉතින් ආපහු අපි මේ අවුරුද්දෙ ඉඳලා පටන් ගෙන තියෙනවා ගොවි සංවිධානවලට ට්‍රැක්ටර්,පොහොර, බීජ වැනි දේවල් ලබාදෙන්න. මේ වගේ ප්‍රතිලාභ ලැබෙන්න ලැබෙන්න ගොවීන් දැන ගන්නවා මේකෙ යම්කිසි හරයක්, වටිනාකමක් තියෙනවා කියලා. ඒ නිසා ගොවීන්ම ඉල්ලා සිටිනවා මෙම සංවිධාන ප්‍රතිසංවිධානය කරන්න කියලා.

**ප්‍රශ්නය :-**

ඇමතිතුමනි, අපි හැමෝම දන්න කරුණක් තමයි පසුගිය කාලේ කෘෂිකර්ම ප්‍රතිපත්තිමය වෙනස්කම් රාශියක් සිදු වීම, ඇමතිතුමා එම කෘෂිකර්ම අංශයේ ප්‍රතිපත්ති වෙනස්වීම් දකින්නේ කුමන ආකාරයට ද?

**පිළිතුර :-**

ඇත්තටම කාලයක් තිබුන අපේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති මොකක්ද කියලා ඇහැව්වොත් උත්තර දෙන්න බැරි තත්වයක්. බලන්න දැන් වී වගාව නුවරඑළියෙත් වී වගා කරනවා. දේශගුණය, වර්ෂාපතනය, පස වගේ දේවල් සැලකිල්ලට අරගෙන නොවෙයි වගා කරන්නෙ. සමහර වෙලාවට හම්බන්තොට ජීවත් වෙන ගොවියෙක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් කරාබු පැලත් ඉල්ලනවා. මොකද? කරාබු මිල ඉහල ගිය හින්ද. නමුත් ඒ ප්‍රදේශයේ කරාබු වැවෙනවද? ඒකෙන් ආදයමක් ලැබෙනවද? අපි අධ්‍යයනයකින් ඒවා හැදින ගෙන නැහැ. කෙසේ වුවත් දැනට ඒ ඒ පෙදෙස්වල තියෙන පස. දේශගුණය, වර්ෂාපතනය ආදී දේවල් සැලකිල්ලට අරගෙන ලංකාව එක එක කලාප. වශයෙන් බෙදලා තියෙනවා. එහෙම බෙදල ඒ ඒ ප්‍රදේශ වල වගා කරන්න පුලුවන් මේ මේ භෝග කියලත් හඳුනාගෙන තියෙනවා. දැනට එම පණිවුඩය ප්‍රාදේශීය ලේකම් මට්ටමෙන් පැතිරිලා තියෙනවා.

**ප්‍රශ්නය :-**

ඔබතුමා කියන අකාරයට ප්‍රාදේශීය විශේෂීකරණය කියන අදහස දැන් දැන් ගොවියා තුළට ගෙන යමින් ඉන්නවා. ඒ වගේම මෑතකාලීන කෘෂිකාර්මික ප්‍රතිපත්ති තුළ සිදු වෙලා තියෙන විශේෂ වෙනසක් තමයි සහනාධාර වගේ ප්‍රතිපත්ති වල වෙනස්වීම. 1990 ජනවාරි 1 වෙනිද ඉඳලා ලංකාවෙ එතෙක් පැවති පොහොර සහනාධාරය ඉවත්කළා. ඒ තත්වය ඔබතුමා දකින්නේ කොහොම ද? ඒ නිසා මොනවගේ බලපෑමක් ගොවියාගේ පැත්තෙන් සිදුවෙලා තියෙනව ද?

**පිළිතුර :-**

ඇත්තටම කියනවා නම් පොහොර සහනාධාරය ඉවත් කිරීම තුලින් ගොවීන්ට වැඩි වියදමක් දරන්නට සිදුවුනා. විශේෂයෙන්ම වී ගොවිතැන් කරන ගොවියාට මේ නිසා සිද්ධවුනා වී ගොවිතැනින් බැහැර වෙන්න. දැනටමත් විශේෂයෙන්ම යල් කන්නයේ දී ගොවියා හුඟාක් බර වෙන්නේ වී ගොවිතැනින් බැහැර වගාවන්ට. විශේෂයෙන්ම ආර්ථික වශයෙන් වාසිදායක වගාවකටය, මිරිස්, ළූණු, රටකජු වගේ බෝගයක් වගා කිරීම වී වගාවට වඩා වාසියි. උදහරණයක් හැටියට ගත්තොත් මගේ කොට්ඨාශයේ තියෙන මහා වාරිමාර්ග යටතේ තියෙන මිනිපේ වගේ තැන්වල ඒ තත්ත්වය හොඳට පැහැදිලි වෙනවා. මිනිස්සු ගර්කින්, ළූණු, මිරිස් වගේ වගාවන්ට වැඩියෙන් බර වෙමින් සිටිනවා.

**ප්‍රශ්නය :-**

දැන් ඔබතුමා දක්වන අදහස් අපේ පර්යේෂණ අත්දැකීම් එක්ක සසඳා බලන කොට ඉස්සර වී. අක්කරයක නිෂ්පාදන වියදමෙන් 10% යි පොහොර සඳහා වැයවෙලා තියෙන්නෙ. පොහොර සහනාධාර ඉවත් කලාට පස්සේ එම ප්‍රමාණය 15% ත් 16% අතර ප්‍රමාණයකින් ඉහල ගියා. ඉතින් මේ තත්වය අඩු කරන්න එනම් වී ගොවියාට ඒ නැතිවුන

ආදයම ලබා දෙන්න සහතික මිල ක්‍රමය මගින් රජය උත්සාහ ගන්නවා. මේ තුලින් සහල් පරිභෝජකයනට පීඩනයක් ඇතිවිය හැකියි, නේ ද ඇමති තුමනි?

**පිළිතුර :-**

ඇත්තටම මෙහිදී අනුගමනය කළ යුතු විකල්ප දෙකක් තියෙනවා. එකක් සහතික මිල වැඩි කිරීම. අනිත් එක නිෂ්පාදන වියදම අඩු කරන එක. ඉතින් අපිට පොහොර සහනාධරය නැවත ලබාදීම අපහසු නිසා අපි වැඩපිළිවෙලක් හදලා තියෙනවා ගොවියා දැරිය යුතු වියදම් එක්තරා ප්‍රමාණයකින් අඩු කරන්න. ඒ අනුව අපි යෝජනා කරලා තියෙනවා ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට ණය පදනමක් මත පොහොර ලබා දෙන්න. ඒකෙන් කාරණා දෙකක් ඉෂ්ඨ වෙනවා. එකක් තමයි බැංකුවලින් ණය ලබා ගැනීමේදී සිදු වන නොයෙක් විදියේ අපහසුකම් වලින් මිදිමට හැකිවීම. අනිත් අතින් වැඩි පොලියකට ණය ගැනීමත් මෙයින් වැළකෙනවා. බැංකු ණය වුනත් ගොවියාට කලට වේලාවට ලැබෙන්නෙ නැහැ. උදහරණයක් හැටියට අපි හිතමු ගොවියෙක් බලාපොරොත්තු වෙනවා නම් ණයක් අරගෙන හොඳ බීජ ටිකක්, හොඳ පොහොර ටිකක් යොදා ගෙන ගොවිතැනක් කරන්න ඕනැ කියලා. ඒත් බැංකුවට ගිහිල්ලා ඇපකාරයෝ සොයාගෙන ණය ගන්න කොට යායෙ වැඩ කෙරිලා ඉවරයි. ඉතින් ගොවීන් කරන්නේ කාගෙන් හරි බිත්තර වී ටිකක් ඉල්ලගෙන මොනවා හරි වපුරල දාන එක. අනිත් එක තමා පොහොර මිල වැඩි නිසා ගොවියා නිර්දේශිත ප්‍රමාණයම පොහොර යොදන්නෙ නැතිකම. මේ නිසා රටේ නිෂ්පාදන ප්‍රමාණය අඩු වෙනවා. ඉතින් අපේ වැඩ පිළිවෙල අනුව අපි බලාපොරොත්තු වෙනවා පොහොර නිර්දේශිත ප්‍රමාණයම යොදයි කියලා. ඒ අනුව ගොවීන් හැටියට තමන්ගේ නිෂ්පාදනය ඉහල දමන ගමන්ම රටක් හැටියට අපටත් පුලුවන් අපේ ඉලක්කය කරා ළඟා වෙන්න.

**ප්‍රශ්නය :-**

ඔබතුමා කියන දේ පර්යේෂණ වලිනුත් ඔප්පු වෙලා තියෙනවා. ඒ කියන්නේ ලබා ගත හැකි අස්වැන්නත්, ගොවියා ලබන අස්වැන්නත් අතර, වෙනසක් තියෙනවා. ඉතින් ඒ වැඩ පිළිවෙල අනුව උත්සාහ දරන්නේ ලබාගත යුතු අස්වැන්න ලබා ගන්න උත්සාහ කිරීම ද?

**පිළිතුර :-**

ඔව්. දැන් බලන්න සී සෑම වගේ දේවල් වල දී ට්‍රැක්ටර් ගාස්තු ඉහල යාම නිසා ගොවීන්ට වැඩි වියදමක් දරන්න සිද්ධ වෙලා තියෙනවා. මේ හින්ද දැනට ගොවි ජන සේවා මධ්‍යස්ථාන වලට අපි රෝද 4 ට්‍රැක්ටර් ලබා දෙනවා. ට්‍රැක්ටර් අයිතිකාරයො අය කරන ප්‍රමාණයෙන් 10% ක් අනිවාර්යයෙන්ම අඩු කරලා ගොවියාට සී සාලා දෙන්න කියලා අපි ඒ අයට නියම කරලා තියෙනවා. ඊට අමතරව ගොවි සංවිධානයේ ගොවි කමිටුවට ඕනැ නම් පුලුවන් ගොවිජන සේවා මධ්‍යස්ථානයත් එක්ක සාකච්ඡා කරලා ඒ ගාස්තුව තවත් අඩු කර ගන්න. ඒ එක්කම අපි කියල තියෙනවා ගොවියාට මුදල් නැත්නම් ණය පදනමක් මත හාලා දෙන්න කියල. ඒ අතරම අපි සකස් කරලා තියෙනවා රෝද 2 ට්‍රැක්ටර් 5000 කුත් ගොවි සංවිධාන වලට ලබා දෙන්න.

**ප්‍රශ්නය :-**

ඇමති තුමනි, දැන් අපි කලින් කිව්වා වගේ ඉස්සර රජයෙන් වැඩි දායකත්වයක් බීජ, පොහොර, රසායන ද්‍රව්‍ය, මෙවලම්, යන්ත්‍ර සූත්‍ර වැනි දේවල්වල නිෂ්පාදනය, තත්ව පාලනය සහ බෙදා හැරීම යන අංශ සම්බන්ධයෙනි. නමුත් කෘෂිකර්ම ප්‍රතිපත්තිවල යම් යම් වෙනස්වීම් නිසා රාජ්‍ය අංශයේ දායකත්වය පසුගිය කාලයේ එන්න එන්නම ඈත් වෙලා තියෙනවා. ඒ තුළ මෙය නැවත කාර්යක්‍ෂම කළ හැක්කේ කොයි ආකාරයට ද?

**පිළිතුර :**

ඇත්තෙන්ම රජ්‍ය අංශයේ දායකත්වය කාර්යක්‍ෂම කළ යුතුයි. හොඳ බීජ යෙදෙව්වම නිෂ්පාදනය 20% කින් වැඩි වෙනවා. පොහොර නිර්දේශිත ප්‍රමාණයම යෙදෙව්වත් හොඳ බීජ නැත්නම් අපේක්ෂිත ඉලක්කයට ලඟා වෙන්න අපහසුයි. ඒ හින්ද හොඳ බීජ නිෂ්පාදනය කරන්න දැනටමත් වැඩ පිළිවෙලක් සකස් කරලා තියෙනවා. පළාත් සභා නිසා පරිපාලනය විමධ්‍යගත වීම තුළින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවයත් පළාත් සභා වලට අයිති වුනා. අන්තිමට වුනේ ඒකට වග කියන්න කවුරුත් නැතිවීමයි. ඒ නිසා ඒ කටයුතු පසුගිය කාලෙ දුර්වල තත්වයකට ඇදී ගෙන ගියා. අපි පර්යේෂණ පවත්වලා අලුත් දේවල් සොයා ගත්තත් ඒවා ජනතාවට ප්‍රයෝජනයට ගන්න තිබුන අවස්ථාව නැති වුනා. ඒක නිසා අප දැන් වැඩ පිළිවෙලක් යොදලා තියෙනවා පුලුවන් තරම් මේයට රජය මැදිහත් වෙලා කොන්ත්‍රාත් පදනමක් මත බීජ නිෂ්පාදනය කරන්න.

**ප්‍රශ්නය :-**

ඊළඟ කාරණය තමයි ඇමතිතුමනි, බීජ සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම, විශේෂයෙන්ම අතිරේක භෝග බීජ අංශය ගත්තම එතන වැඩිපුරම ඉන්නේ පෞද්ගලික අංශය. එද රාජ්‍ය ආයතන වලට තිබුණ වෙළඳපොල සම්පූර්ණයෙන්ම ග්‍රහණය කර ගෙන ඉන්නවා පෞද්ගලික ආයතන. ඉතින් මෙහෙම උනහම වෙන්නෙ තත්වයෙන් බාලවර්ගයේ බීජ ලංකාවට ආනයනය කිරීම. ආනයනය කරනවිට ප්‍රමිතිය පාලනය සම්බන්ධයෙන් කිසිම බලපෑමක් ඒ නිසා කරන්න බැහැ. මිල පාලනයත් අපහසුයි. උදහරණයක් ගත්තොත් පසුගිය කාලේ ලංකාවට නුසුදුසු බී එළු බීජ ආනයනය කල නිසා මෝටාර් බැහීම සිද්ධ වුනා. ඉතින් ඔබතුමා හිතනවද රජයේ පාලනයක් තිබීම තුලින් මේ තත්ත්වය වලක්වා ගන්න පුලුවන් කියලා.

**පිළිතුර :-**

මුලදීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් එළු බීජ ගෙනැවිත් දුන්නා ඉන්දියාවෙන්. එතකොට ඔය විදියේ ප්‍රශ්නයක් ඇතිවුනේ නැහැ. පස්සේ ඉන්දියාවෙන් කෙලින්ම බීජ ලබා නොදෙන තත්වයක් ඇතිවුනා. ඒනිසා අපිට සිදු වුනා බීජ ඕලන්දයෙන් ආනයනය කරන්න. ඉතින් මොනවා හරි හේතුවක් නිසා ප්‍රරෝහණ ශක්තියෙන් අඩු බීජ තමයි අපට ලැබුනෙ. කාලාන්තරයක් තිස්සේ ගොවියා දෙපාර්තමේන්තුව කෙරෙහි දැඩි විශ්වාසයක් තිබ්බා. නමුත් දෙපාර්තමේන්තුව එතැනින් මිදුනට පස්සේ පාලනයක් නැතිව ගියා. මොකද පෞද්ගලික අංශය බලන්නෙ ගොවියා ගැන නොවෙයි. ලාභය ගැන පමණයි. ඒ නිසා රජයේ අධීක්ෂණයක් නැතිව පාලනයක් නැතිව පිටින් බීජ ආනයනය කිරීම භයානකයි.

**ප්‍රශ්නය :-**

ඇමතිතුමනි, එතනදී අපට පුලුවන් නේද ගොවි සංවිධාන මගින් මෙයට පිළියමක් යොදන්න?

**පිළිතුර :-**

ඇත්තටම අපි එහෙම කලා. සමාන්‍යයෙන් ලියාපදිංචි වෙලා තියෙන, හොඳ අවබෝධයකින් ක්‍රියාකරන, ගොවි සංවිධානවල ගොවීන් බීජ ප්‍රරෝහණ ශක්තිය පිළිබඳව සහතික කරලා තියෙන බීජ පමණක් ගන්න පෙළඹුනා.

**ප්‍රශ්නය :-**

දැන් පසුගිය කන්නයක ගොවීන් තක්කාලි විශාල වශයෙන් වගා කළා. ඒවා විකුණා ගන්න බැරිව අපතේ ගියා. නමුත් මේ කාලේ තක්කාලි මිලයි. ගිය අවුරුද්දේ මිල පහත බැස්ස නිසා මේ අවුරුද්දේ ගොවියෝ වගා කලේ නැහැ. ඒ වගේ දේවල් වලක්වන්න කළ යුත්තේ මෙනවාද?

**පිළිතුර :-**

ගොවි සංවිධාන මගින් වගා රටාවක් පිළියෙල කර, වෙළඳපොළ හසුරුවා ගැනීමට හැකි අන්දමට කටයුතු කිරීම අවශ්‍යයි. නිෂ්පාදකයා වෙළඳපොල පිළිබඳව අවබෝධයෙන් කටයුතු කළ යුතු නිසා ගොවියෝ සංවිධානය විය යුතුමයි.

**ප්‍රශ්නය :-**

ඇමතිතුමනි, දැන් ඔබ තුමා ණය ක්‍රමය ගැන කථා කරානෙ. විශේෂයෙන් ම අපේ ණය ක්‍රමය යොමු වෙලා තියෙන්නේ නිෂ්පාදනයට. දැන් සමහර රටවල් වල තියෙනවා නිෂ්පාදන

ගබඩා කරන්නත් ණය දෙනවා. ඇමරිකාව වගේ රටවල් වල ගොවියො තමන්ගෙ නිෂ්පාදන වෙළඳපොලේ මිල ඉහල යනකං ගෙදර තියා ගන්නවා. රජයෙන් ගෙවනවා 75% ක් විතර සහතික මිලෙන්. මොකද අර ඇමතිතුමා කිව්වා වගේ ට්‍රැක්ටර් ගාස්තු ගෙවන්න. ඉතින් ඒ වගේ ක්‍රමයක් අපිත් ක්‍රියාත්මක කලොත් හොඳයි නේ ද?

**පිළිතුර :-**

දැන් එය ක්‍රියාත්මක කරනවා ඒක. අපි මිනිපේ ඇති කරගෙන යනවා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සහය ඇතිව. සංවර්ධන බැංකුවෙන් වී අරගෙන ගබඩා කරනවා. ඒ අය වෙනම එදාට ගොවියාට මුදලක් දෙනවා. එම වී ටික හොඳ මිලකට විකුණල ඉතිරි මුදල් ආපසු දෙනවා. ඒ ක්‍රමය දැනට ක්‍රියාත්මක කරනවා.

**ප්‍රශ්නය :**

අපේ තියෙන පළාත් සභා මට්ටමින් අපට පුලුවන් නම් අඩු තරමින් අපේ අමාත්‍යාංශය යටතේ කිසියම් විධියේ සම්බන්ධීකරණයක් ඇති කරන්න. ඒ කියන්නේ පළාත් සභා මට්ටමින් කන්නය පටන් ගන්න මත්තෙන් මොනව ද ඒ ඒ පළාත් සභාවන් තුළ වවන්නෙ, කොපමණ අක්කර ප්‍රමාණයක් වවනව ද කියල සැලැස්මක් හදන්න. ඒක මේකට ඇති මූලිකම විසඳුමක් වෙයි කියලා මම හිතනවා. ඔබ තුමා එකඟ වෙයි ද?

**පිළිතුර :-**

ඒක දැන් අපි කරලා තියෙනවා. දැනට මේ ඉලක්ක කරා ලඟ වෙනවා. අපි පලාත් සභා ඔක්කොම කැඳවලා කිව්වා ලංකාවේ වී ගොවිතැන් කරනවා නම් මෙච්චර අක්කර ප්‍රමාණයක් වගා කරන්න ඕනා කියලා. ඒවා ඔක්කොම හදලා ඉවර වෙලා ඒ ඒ පලාත් සභාවල් වලට භාර දීලා තියෙනවා. දැනට කරන ප්‍රමාණයත්, ඒ ගොල්ලො ලඟා විය යුතු ඉලක්කත් දක්වලා මධ්‍යම පළාතේ පස දේශගුණය ආදිය සැලකිල්ලට් අරන්. ඒ පළාතේ වගා කරන්න වඩාත් සුදුසු භෝග සැලසුම අපි කියන්නෙ නැහැ. වයඹ පළාතේ ක්‍රියාත්මක කරන්න කියලා. වයඹ පළාතට සුදුසු එක ඒ ගොල්ලො වවනවා. දැන් අපි කියමු එළු ගත්තම මේ රටේ මිනිස්සු ඉල්ලන්නෙ එළු. අපි තමයි මේ බී එළුයි. රතු එළුයි කිය කිය වෙනම හොය හොයා දෙන්න ගිහිල්ලා තියෙන්නෙ. දැන් අපි කියමු සීනි. සීනි ගත්තම හැම කෙනෙක්ම සුදු සීනි ඉල්ලන්නෙ නැහැ. සමහර අයට අඩු මිළකට හොඳයි දුඹුරු සීනි. නමුත් අපි සුදු කරලම දිලා තවත් ඒ මිනිහට ගානක් ගෙවන්න සලස්වලා තියෙනවා. දැන් එකක් තමයි මහ කන්නයේ නුවරඑළියේ තෙත් කලාපයේ වතුර බැහැල යන බෑවුම් ඇති කඳු ප්‍රදේශ වල එළු වගා කරන්න පුළුවන්. නමුත් වේලා ගන්න අපහසු එක ප්‍රශ්නයක් නොවයි. දැන් අර කොල එළු, කොලත් එක්ක අලයකුත් තියෙනවා. ඒවා වෙළඳපොලට එවන්න ක්‍රමයක් හද ගත්තොත් ඇත්තටම පිටින් ගෙන්වන එක සම්පූර්ණයෙන්ම නවත්තන්නත් පුළුවන්.

**ප්‍රශ්නය :-**

මම හිතනවා ඇමතිතුමනි, ග්‍රාමීය මට්ටමේ රාජ්‍ය තන්ත්‍රයේ සැලසුම් වලට විශාල සංවිධානාත්මක සැලැස්මක් අවශ්‍ය යි. දැනට ගම්බද ගොවියා ළඟට යනවා නිලධාරීන් විසිහතර දෙනෙක් පමණ එක එක වේලාවට හැබැයි මෙම නිලධාරීන් දෙන්න සහයෝගය එකතු වෙලා සමස්තයක් හැටියට දෙනවා නම් එයිට වඩා හුහාක් සාර්ථකයි කියන්න පුළුවන් නේ ද?

**පිළිතුර :-**

ඇත්තටම කියනවා නම් මමත් ඒක පිළිගන්නවා. එච්චර ඕනා නෑ. දැන් අපේ අමාත්‍යාංශය ගන්න. ගොවි විශ්‍රාම වැටුප් ගැන කියන්න යනවා එක කට්ටියක්. ගොවි සංවිධානය ගැන කියන්න යනවා තව කට්ටියක් තව කට්ටියක්. යනවා වගා කරන එක ගැන කියන්න. රක්ෂණය ගැන කියන්න. ඉතින් මෙහෙම විටින් විට ගියහම ගොවීන්ගේ කාලය ගත වෙනවා. ඉතින් මම දැන් මගේ නිලධාරීන්ට දන්වලා තියෙන්නේ යන කොට කට්ටිය ඔක්කොම එකට යන්න කියලා. න්‍යාය පත්‍රයක් හදලා ඒකට අනුව විනාඩි දහය, පහලොව එක එක්කෙනා කියන එක. නැත්නම් මිනිස්සුන්ට එපා වෙනවා.

**ප්‍රශ්නය :-**

ඒක තමයි දැන් පෙන්වන්න උත්සාහ කරේ. ගොවිපල මට්ටමෙන් සම්බන්ධීකරණයක් වාගෙම පළාත් මට්ටමෙනුත්, මහා ආණ්ඩුව මට්ටමෙනුත්, සම්බන්ධීකරණයක් අවශ්‍ය වෙනවා එතකොට මේක තමයි එකම අර ගලා යන ක්‍රියාවලිය. ඒ තුල තමයි අපි කියන ඔය ජයග්‍රහණය ලබා ගන්න පුළුවන් වෙන්නෙ. එහෙම නොවුනහොත් ප්‍රශ්න වලට මුහුණදෙන්න වෙනවා නේද අනිවාර්යයෙන්ම?

**පිළිතුර :-**

ගොවි සංවිධාන පිළිබඳව ප්‍රේමදස ජනාධිපති තුමන්ගේ මැතිවරණප ප්‍රකාශනයේ සඳහන් කරනවා මුළු රටම වැළඳ ගන්නු ස්වාධීන ගොවි සංවිධානයක් පිහිටුවිය යුතු යි කියලා. මේ 1988 මැතිවරණ ප්‍රකාශනය අරගෙන ගිහිල්ලා මම එතුමාගෙන් ඇහුවා කොයි විදිහට ද මේක පිහිටුවන්න අවශ්‍ය කියලා. ඒකට වෙනම ක්‍රමයක් නැහැ. ස්වාධීන ගොවි සංවිධානයක්. ලලිත් ඇතුලත්මුදලි මහත්මයා තමයි එවකට හිටිය කෘෂිකර්ම ඇමති තුමා, එතුමා මට කිව්වා මේක පිහිටුවන්න මූලිකව කටයුතු කරන්න කියලා. මේ ගොවි සංවිධාන තිබුනා ඉඩම් අමාත්‍යාංශයේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙ. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ. සහ ඒ වගේ විවිධ දෙපාර්තමේන්තු හා සංස්ථාවල. මම ඒ සියල්ලම කැඳෙව්වා. ගොවිජන සේවා එකෙන් කියනවා අපේ ගොවි සංවිධානය කියලා. වාරිමාර්ග එකෙන් කියනවා අපේ ගොවි සංවිධාන කියලා. ඔහොම ඔහොම කියා ගන්න තිතිනවයකි තිබුණා. පස්සේදී මම ඒ ඔක්කොගෙම ප්‍රධානීන් ගෙන්නලා සාකච්ඡා කලා. මේ මැතිවරණ ප්‍රකාශනයෙ හැටියට ඔක්කොම එකඟ වුනා ස්වාධීන ගොවි සංවිධානයක් පිහිටුවීමට. මම මේක කොහෙන්වත් ඉගෙන ගත්තා නොවෙයි. ගොවි පවුලක කෙනෙක් හැටියට මම මේක කරන විදිය කල්පනා කලා. ඒ විදියටයි ගොවි සංවිධාන ආරම්භ කලේ. අද ගොවියා ඉඩම් ප්‍රශ්නයට මුහුණ දීලා තියෙනවා. පවුලේ සංඛ්‍යාව වැඩිවීමත් සමගම ඉඩම් ප්‍රමාණය පුංචිවෙලා. මේ කුඩා ඉඩම් ප්‍රමාණයෙන් උපරිම ප්‍රයෝජන ගන්න තාක්ෂණික ක්‍රම කියා දෙන්න ඕන. වෙළඳපල හා මිල පිළිබඳ අව බෝධයක් ඇතුව නිපදවන්න ඕන. මේ සඳහා ගොවිසංවිධාන අවශ්‍ය යි.

**ප්‍රශ්නය :**

ඒවා ක්‍රියාත්මක කරන්න මොන වගෙ බාධක ද තියෙන්නෙ?

**පිළිතුර :-**

බාධකය හැටියට දැනට තිබෙන එකක් තමයි මම මුලින් කිව්වා වගේ මුලින් සංවිධානය වීම හරියට කෙරුනෙ නෑ. ඒ කියන්නේ අපි ග්‍රාමසේවක මහත්වරුන්ටනෙ මේක භාර දුන්නෙ. ඉතින් ඇත්තටම ඒ සමහරක් අය ඒක අවබෝධයකින් කලාද දන්නේ නැහැ. ඒ ගොල්ලන්ට වැඩ බහුල නිසා ඒක හරියට නොකර හැරියද දන්නෙත් නැහැ. ඒ කොහොමවුනත් මට දැන් පෙනිලා තියෙනවා කොටසක් ප්‍රතිලාභ ලබන කොට තවත් කොටසක් කිනවා අපේ එකත් ආපසු ප්‍රතිසංවිධානය කරන්න ඕනා කියලා. ඉතින් අරවගේ එකතැනක ඉඳලා මුලු රටේම වැවෙන්නෙ මොනවද කියලා බලන්න පුලුවන් තත්ත්වයක් හදන්න නම් පුලුවන් වෙයි. මොකද මේ ගොවියො ගොනු කර ගන්න දැන් පුලුවන්කමක් ලැබිලා තියෙන නිසා. මේ සඳහා ජාතික මට්ටමේ සංවිධානයක් ඕනෑ. එය බිහිවෙන්න ඕන කාර්යක්ෂම ගම් මට්ටමේ ගොවි සංවිධාන තුලින්. එ මගින් මුළු රටටම අවශ්‍ය වගා සැලසුම් හා මිල පිළිබඳ තීරණයන් ගත හැකියි.

සාකච්ඡා කලේ
එල්. පී. රූපසේන

ඩබ්. ජී. සෝමරත්න